## පළමුවන දේව ප්‍රකාශනය

උපදේශකයා 3:2-6, 12-14

උපදේශකයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**දේව භය ඇති තැනැත්තා මාපියන් ගරු කරන්නේ ය.**

සමිඳාණෝ දරුවන් මගින් ඔවුන්ගේ පියා ගෞරවයට පත් කරන සේක. ඇගේ පුත්‍රයන් පිට මවකගේ අයිතිය තහවුරු කරන සේක. තම පියාට ගෞරව කරන්නා තම පාපවලට වන්දි ගෙවන්නේ ය. තම මවට ගෞරව කරන්නා නිධානයක් රැස් කරන්නෙකු වැනි ය. තම පියාට ගෞරව කරන්නාට තම දරුවන් මගින් ප්‍රීතිය ලැබෙන්නේ ය. ඔහු යාච්ඤා කරන දවසෙහි දී ඔහුගේ යාච්ඤාව අසනු ලබන්නේ ය. තම පියාට ගෞරව කරන තැනැත්තාට දිගායු ලැබෙන්නේ ය. තම මව සතුටු කරන තැනැත්තේ සමිඳුන්ට කීකරු වන්නේ ය. මාගේ පුත්‍රය, ඔබේ පියාගේ මහලු වයසෙහි දී ඔහුට ආධාර කරන්න. ඔහුගේ ජීවිත කාලෙහි දී ඔහුගේ සිතට වේදනා නොදෙන්න. ඔහුගේ කල්පනා ශක්තිය අඩු වුව ද ඔහුට අනුකම්පාව දක්වන්න, සවි ශක්තියෙන් සිටින ඔබ, ඔහු හෙළා නොදකින්න. පියෙකුට දක්වන කරුණාව අමතක කරනු නොලබන්නේ ය. එය ඔබේ පව් උදෙසා වන්දියක් වශයෙන් සැලකෙන්නේ ය.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 128:1-5

ඔබගේ පිළිතුර: සමිඳුන් කෙරෙහි ගරුබිය ඇති සියල්ලෝ භාග්‍යවන්තයෝ ය.

ගීය: සමිඳුන් කෙරෙහි ගරුබිය ඇති, එතුමන්ගේ මාර්ගයෙහි හැසිරෙන සියල්ලෝ භාග්‍යවන්තයෝ ය. මන්ද, ඔබේ ශ්‍රම ශක්තියේ ප්‍රතිඵලය ඔබ භුක්ති විඳින්නෙහි ය. ඔබ වාසනාවන්ත ය; ඔබට ශුභසිද්ධ වන්නේ ය.

ඔබේ බිරිඳ ඔබේ නිවෙස තුළ පල දෙන මිදිවැලක් මෙන් වන්නී ය. ඔබේ දරුවෝ ඔබේ මේසය වටා ඔලීව පැල මෙන් වන්නෝ ය.

සමිඳුන් කෙරෙහි ගරුබිය දක්වන්නා මෙසේ ආසිරි ලබන්නේ ය. සමිඳාණෝ සියොන්හි සිට ඔබට ආශීර්වාද කරන සේක් වා! ඔබේ මුළු ජීවිත කාලයේ දී ජෙරුසලමේ සුබ සෙත ඔබට දක්නට ලැබේ වා!

## දෙවන දේව ප්‍රකාශනය

කොලොස්සි 3:12-21

පාවුලු තුමන් විසින් කොලොස්සිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**ක්‍රිස්තියානි පවුලේ සහ සමාජයේ යුතුකම්.**

එබැවින් දෙවියන් වහන්සේගේ තෝරාගත්, සැදැහැවත්, ප්‍රේමවන්ත අය වශයෙන්, දයානුකම්පාවෙන් ද කරුණාවෙන් ද නිහතමානිකමෙන් ද මෘදුකමෙන් ද ඉවසිලි-වන්තකමෙන් ද සැරසී සිටින්න. එකිනෙකා ගැන ඉවසමින් යමෙකුට විරුද්ධ ව පැමිණිල්ලක් ඇත්නම්, එකිනෙකාට කමා කරන්න. ස්වාමින් වහන්සේ ඔබට කමා කළාක් මෙන් ඔබත් එකිනෙකාට කමා කළ යුතු ය. මේ සියල්ලට ඉහළින්, සියල්ල සම්පූර්ණ ලෙස ඒකාබද්ධ කරන ප්‍රේමයෙන් සැරසෙන්න. ක්‍රිස්තුන් වහන්සේගේ සාමය ඔබේ සිත් තුළ රජකම් කෙරේ වා! එක ම ශරීරයේ කොටස් වශයෙන් ඔබ කැඳවන ලද්දේ මේ සඳහා ය. කෘතඥතාව ද දක්වන්න. ක්‍රිස්තුන් වහන්සේගේ දහම් පණිවුඩය ඔබ තුළ සියලු ප්‍රඥාවෙන් සමෘද්ධ ව පවතීවා. එකිනෙකාට ඥානවන්ත

ලෙස අවවාද අනුශාසනා කරන්න. ගීතිකාවලින් ද ගායනාවලින් ද ශුද්ධ ගී වලින් ද සිතෙහි ස්තුතිවන්තකමින් ද දෙවියන් වහන්සේට ගායනා කරන්න. තවද, ඔබ වචනයෙන් හෝ ක්‍රියාවෙන් හෝ කුමක් කරතත්, ඒ සියල්ල ජේසුස් ස්වාමීන් වහන්සේගේ නාමයෙන් කරමින් උන් වහන්සේ තුළින් දෙවි පියාණන් වහන්සේට ස්තුති කරන්න. භාර්යාවෙනි, කිතුනුවන්ගේ යුතුකම ලෙස ඔබේ පුරුෂයන්ට යටත් ව සිටින්න. පුරුෂයෙනි, රළු පරුෂ නොවී ඔබේ භාර්යාවන්ට ප්‍රේම කරන්න. දරුවෙනි, සියලු කාරණාවල දී දෙමව්පියන්ට කීකරු වන්න. මන්ද, ඔබ එසේ කිරීම ස්වාමීන් වහන්සේට ප්‍රීතියකි. පියවරුනි, ඔබේ දරුවන් කුපිත නොකරන්න. එසේ කළොත් ඔවුන් කලකිරෙනු ඇත.

දේව වචනය මෙසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** කොලොස්සි 3:15-16

ආලේලූයා! ආලේලූයා!
ක්‍රිස්තුන් වහන්සේගේ සාමය ඔබේ සිත් තුළ රජකම් කෙරේ වා! ක්‍රිස්තුන් වහන්සේගේ දහම් පණිවුඩය ඔබ තුළ සියලු ප්‍රඥාවෙන් සමෘද්ධ ව පවතීවා.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මතෙව් 2:13-15, 19-23

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**ළදරුවා රැගෙන මිසරයට යන්න.**

ශාස්ත්‍රවන්තයන් ගිය පසු ස්වාමීන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් ජෝසෙප්ට දර්ශනය වී, ඔහු අමතා, "නැඟිට ළදරුවා ද උන් වහන්සේගේ මෑණියන් ද රැගෙන මිසරයට ගොස්, මා දන්වන තුරු එහි නවතින්න. මන්ද, හෙරොද් රජ ළදරුවා මරාදැමීමට සොයති"යි කී ය. ඔහු රාත්‍රියෙහි නැඟිට ළදරුවා ද උන් වහන්සේගේ මෑණියන් ද රැගෙන මිසරයට ගොස්, හෙරොද්ගේ මරණය දක්වා එහි සිටියේ ය. මෙසේ වූයේ, "මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවාගතිමි"යි කියා ස්වාමීන් වහන්සේ විසින් දිවැසිවරයා කරණකොටගෙන කියන ලද කීම ඉටු වනු පිණිස ය.
හෙරොද් මියගිය පසු, සමිඳාණන් වහන්සේගේ දූතයෙක් මිසරයේ දී සිහිනයකින් ජෝසෙප්ට දර්ශනය වී, ඔහු අමතා, "නැඟිට ළදරුවා ද ඔහුගේ මෑණියන් ද රැගෙන ඉශ්රායෙල් දේශයට යන්න; ළදරුවාගේ ජීවිතය නසන්න තැත් කළ අය මළහ"යි කී ය. එවිට ඔහු නැඟිට ළදරුවා ද උන් වහන්සේගේ මෑණියන් ද රැගෙන ඉශ්රායෙල් දේශයට පැමිණියේ ය. එහෙත්, අර්කෙලාවුස් සිය පිය වූ හෙරොද් වෙනුවට ජුදා දේශයේ රජකම් කරන බව අසා, ඔහු එහි යන්න බිය ව, සිහිනයකින් දන්වනු ලැබ ගලීලයේ පෙදෙස්වලට ගොස්, එහි නාසරෙත් නුවර විසී ය. මෙසේ වූයේ, "උන් වහන්සේ නාසරීයයෙකැ"යි දිවැසිවරයන් විසින් කියන ලද කීම ඉටු වන පිණිස ය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.